# කෘෂිකර්ම අමාත්‍යාංශය
## கமத்தொழில் அமைச்சு
## Ministry of Agriculture

නො. 288, ශ්‍රී ජයවර්ධනපුර මාවත, රාජගිරිය, ශ්‍රී ලංකාව.
இல. 288, ஸ்ரீ ஜயவர்தனபுர மாவத்தை, ராஜகிரிய, இலங்கை.
No. 288, Sri Jayawardenepura Mawatha, Rajagiriya, Sri Lanka.


මගේ අංකය. / எனது இல. / My No. 7/1/3/2018 යල

ඔබේ අංකය. / உமது இல. / Your No.

දිනය. / திகதி. / Date. 2018.04.19

ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්,
සියලුම දිස්ත්‍රික් භාර ගොවිජන සංවර්ධන
නියෝජ්‍ය / සහකාර කොමසාරිස්වරුන්,
සියලුම ගොවිජන සංවර්ධන ප්‍රාදේශීය නිලධාරීන්,

මහවැලි අධ්‍යක්ෂ ජනරාල්,
වාරි කළමනාකරණ අංශයේ අධ්‍යක්ෂ,

කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්,
පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂවරුන්,

සභාපති, ලංකා පොහොර සමාගම,
සභාපති, කොළඹ කොමර්ෂල් පොහොර සමාගම,

***සහනාධාර පොහොර බෙදාහැරීමේ චක්‍රලේඛ 1 / 2018 - සංශෝධන (I) – 2018 යල කන්නය***

1. යම් ගොවියකු එකම කන්නයක දී මහා වාරි, සුළු වාරි හා වර්ෂා පෝෂිත යන වාරි ක්‍රම එකකට වඩා වැඩි ගණනක වෙන් වෙන්ව වී වගා කරන අවස්ථාවල දී, ඔහු වගා කරන මුළු වගා බිම් ප්‍රමාණය හෙක්ටයාර දෙක (02) (අක්කර 05) නොඉක්මවන ලෙස එක වරකට වැඩි වාර ගණනක දී එම ගොවියාට සහනාධාර පොහොර ඉල්ලුම් කළ හැකි වේ. (එක් වරකට වැඩි වාර ගණනක දී ඔහු ගේ නම ලැයිස්තුවට ඇතුළත් කළ හැකිය.) එහෙත් ඒ සෑම අවස්ථාවකදීම ගොවියා ගේ හැඳුනුම්පත් අංකය හා DO අනුක්‍රමික අංකය එකම විය යුතුය.

2. 2017 / 18 මහ කන්නයේ දී හෝ ඊට පෙර කන්න වල දී පොහොර සහනාධාර මුදල් ලබාගත් යම් ගොවියෙක් මුදල් ලබාගෙන වගා නොකර සිටී නම් හෝ මෙතෙක් එම මුදල් ඊට යාබද කන්නයේ දී හිලව් කිරීමට කටයුතු නොකර ඇත්නම් එම මුදල් මෙම කන්නයේ දී හිලව් කිරීමට අවශ්‍ය පියවර ගත යුතුය. (මෙහි දී අදාළ කන්නයේ වගා කරන ලද භූමි ප්‍රමාණය පමණක් සළකා හිලව් කිරීම සිදු කළ යුතුය.)

3. යම් ගොවි මහතෙකු මීට පෙර කන්නයක දී පොහොර සහනාධාරය සඳහා ලියාපදිංචි වී ඔහු ගේ තොරතුරු දත්ත පද්ධතියට ඇතුළත් කර ඇත්නම් ඔහුගෙන් නව ඉල්ලුම්පත්‍රයක් ලබා ගැනීම අවශ්‍ය නොවන අතර ඔහු ගේ DO අනුක්‍රමික අංකය ඇතුළු අනෙකුත් අවශ්‍ය තොරතුරු ආකෘති පත්‍රයේ සටහන් කිරීම ප්‍රමාණවත් වේ.

ඩී.වී.බන්දුලසේන
ලේකම් (වැ.බ.)
කෘෂිකර්ම අමාත්‍යාංශය

පිටපත් සඳහා කරුණාකර අනෙක් පිට බලන්න


ලේකම් / செயலாளர் / Secretary — දුරකථන / தொலைபேசி / Telephone-2868920; ඊ-මේල් / மின்னஞ்சல் / E- mail -sec.agri@yahoo.com; ෆැක්ස් / தொலைநகல் / Fax -2863497

කාර්යාලය / அலுவலகம் / Office — දුරකථන / தொலைபேசி / Telephone - 2869553, 2872093, 2872097; ඊ-මේල් / மின்னஞ்சல் / E- mail - info@agrimin.gov.lk; ෆැක්ස් / தொலைநகல் / Fax - 2868910

පිටපත්:

1. කෘෂිකර්ම ගරු අමාත්‍යතුමා ඇතුළු සියළු ගරු කැබිනට් අමාත්‍යවරු
2. කෘෂිකර්ම ගරු රාජ්‍ය අමාත්‍යතුමා
3. ලේකම්, මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය
4. ලේකම්, රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය
5. ලේකම්, නාගරික සංවර්ධන හා ජල කළමනාකරණ අමාත්‍යාංශය
6. විගණකාධිපති, විගණකාධිපති දෙපාර්තමේන්තුව
7. ලේකම්, පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශය
8. සියලුම පළාත් ප්‍රධාන ලේකම්වරුන්
9. සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන්
10. අතිරේක ලේකම් (කෘෂි තාක්ෂණ), කෘෂිකර්ම අමාත්‍යාංශය
11. අතිරේක ලේකම් (සංවර්ධන), කෘෂිකර්ම අමාත්‍යාංශය
12. ප්‍රධාන ගණකාධිකාරි, කෘෂිකර්ම අමාත්‍යාංශය
13. සියලුම ප්‍රාදේශිය ලේකම්වරුන්
14. ප්‍රධාන අභ්‍යන්තර විගණක, කෘෂිකර්ම අමාත්‍යාංශය
15. සභාපති, කෘෂිකර්ම හා කෘෂි රක්ෂණ මණ්ඩලය
16. අධ්‍යක්ෂ, ජාතික පොහොර ලේකම් කාර්යාලය
17. ජාතික පොහොර ලේකම් කාර්යාලයේ දිස්ත්‍රික් සහකාර අධ්‍යක්ෂවරුන්